බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයේ සරඹ උපදේශක (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වන උසස්කිරීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: බන්ධනාගාර
යොමු අංකය : ඩී8/21/90/SOR/II දිනය: 2022.06.23
ඩී8/21/90/SOR/II දිනය :2024.02.12

1.2 අමාත්‍යාංශය:අධිකරණ හා ජාතික ඒකාබද්ධතා
යොමු අංකය : MOJ/Prison AD/Ad 02/ සරඹ උපදේශක දිනය: 2024.10.03

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය :DMS/1146/VIII දිනය :2021.10.13

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය : EST-2/RECRU/05/4873 දිනය :2022.12.06
යොමු අංකය : EST-2/RECRU/05/4873 දිනය :2023.11.29

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : දිනය :

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය : PSC/EST/03-01-18/01/2024 දිනය :2025.03.27

02. පත් කිරීමේ බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : නියාමන සේවා

3.2 ශ්‍රේණි : III,II,I

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

"බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාක්ෂාත් කර ගැනීමට සහාය වීමත්, බන්ධනාගාර නිලධාරීන්හට සණ සරඹ හා ශාරීරික අභ්‍යාස පුහුණු කිරීමට අදාළ රාජකාරි ඉටුකිරීම ඇතුළුව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන රාජකාරි හා කාර්යයන් ඉටුකිරීම."

3.4 කාර්යයන් පැවරීම:

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත යොග්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.)

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : RS - 01 - 2016

5.2 වැටුප් පරිමාණය : : 29,540-7 x 300-27 x 370 - 41,630/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර:

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 29,540/- |

nd

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම,අනුමත තනතුරු සංඛ්‍යාව හා තනතුරුවලට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සරඹ උපදේශක | III,II,I | 01 | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාක්ෂාත් කර ගැනීමට සහාය වීමත්, බන්ධනාගාර නිලධාරීන්හට සණ සරඹ හා ශාරීරික අභ්‍යාස පුහුණු කිරීමට අදාළ රාජකාරි ඉටුකිරීම ඇතුළුව ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන රාජකාරි හා කාර්යයන් ඉටුකිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : සරඹ උපදේශක - 01
ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සළකනු ලැබේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය : මෙම තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති බැවින් බඳවා ගැනීමේ ක්‍රමය අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 02) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 03) |

8.2. කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3. කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන්නේ කවුරුන්ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම
} බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

09. භාෂා ප්‍රවීණතාවය :

9.1.

| භාෂාව | | ලබා ගත යුතු භාෂා ප්‍රවීණතාව |
|---|---|---|
| 01 | රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ දී ලබා ගත යුතුය. |
| 02 | අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම.

### 10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.

#### 10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. උසස් කිරීමේ දිනට සරඹ උපදේශක තනතුරේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර අට (08) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අට (08) ක් උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර අට (08) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය පරිදි ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

### 10.2. II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

#### 10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. සරඹ උපදේශක තනතුරේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හත (07) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක 07 ක් උපයාගෙන තිබීම.

II. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම

බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය පරිදි ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය - සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ : අදාළ නොවේ.

nd

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහනය : මෙම උසස් කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින නිලධාරියාට පමණක් අදාළ වන අතර, ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධි විධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ එම තනතුරට පත්කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

(i) RS – 01 – III ශ්‍රේණිය

(අ) III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසයින් අවුරුදු 08 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්

(ආ) III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 08කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වුවද, II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පටිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්

RS- 01- III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන

සකස් කළේ : අත්සන : ..........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :............ ඩබ්ලිව්.ටී.එන්. වසන්ත කුමාර

තනතුර :...... පරිපාලන නිලධාරී, බන්ධනාගාර මූලස්ථානය

දිනය : 2025/05/27 කොළඹ - 09.

පරීක්ෂා කළේ : අත්සන : ..........................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :............ ඩොනල්ඩ් මුරගේ

තනතුර :...... බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්), බන්ධනාගාර මූලස්ථානය

දිනය : 2025/05/27 කොළඹ 09.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :......................................

තනතුර :..................................

නිල මුද්‍රාව : එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.

දිනය : 2025/05/ 28

18. අමාත්‍යාංශ නිර්දේශය

යොමු අංකය : MOJ/Prison AD /AD 03/සරඹ උපදේශක

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.03.27 දින අනුමත කරන ලද බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයේ සරඹ උපදේශක තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

නම : අයෙෂා ජිනසේන

ලේකම්
ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන
ලේකම්
(අදාළ අමාත්‍යාංශ ලේකම්)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
නිලමුද්‍රාව : ..........................................
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

දිනය : 2025/05/19

19. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය : PSC/EST/03-01-18/01/2024

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයේ සරඹ උපදේශක (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පටිපාටිය 2025.03.27 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........................................

නම : ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2025/09/2

නිල මුද්‍රාව : ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර

ඇමුණුම 01

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම :බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයට අයත් තනතුරු වන සරඹ උපදේශක තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. සරඹ උපදේශක රාජකාරි හා වගකීම් | පැය 02 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| I.සරඹ උපදේශක රාජකාරි හා වගකීම් | සරඹ උපදේශක රාජකාරි හා වගකීම් ඇසුරින් |

සකස් කළේ :
අත්සන : ..................................
නම : ඩබ්ලිව්.ටී ... ත්ත කුමාර
තනතුර : සරඹ ... ාරි - I ... බන්ධනාගා ... ස්ථානය ... කොළඹ - 09.
දිනය : 2025/05/27

පරීක්ෂා කළේ :
අත්සන : ..................................
නම : ඩොනල්ඩ් මුරගේ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්) බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.
දිනය : 2025/05/27

අත්සන : ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ..................................
තනතුර : ..................................
දිනය : 2025/05/28
නිල මුද්‍රාව : ..................................
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

## විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම :බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයට අයත් තනතුරු වන සරඹ උපදේශක තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. බන්ධනාගාර ආඥා පනත හා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | පැය 03 | 100% | 40% |
| II. ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති | පැය 02 | 100% | 40% |
| III. මුදල් රෙගුලාසි හා මූල්‍ය ක්‍රම | පැය 02 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

01. විභාගය සඳහා වන විෂය නිර්දේශය
   - I. බන්ධනාගාර ආඥාපනත හා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග
   - II. ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති
   - III. මුදල් රෙගුලාසි හා මූල්‍ය ක්‍රම

සකස් කළේ :
අත්සන :..........................................
නම : ඩබ්ලිව්.ටී.එන්. වසන්ත කුමාර
තනතුර : පරිපාලන නිලධාරී
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.
දිනය : 2025/05/27

පරීක්ෂා කළේ :
අත්සන :..........................................
නම : ඩොනල්ඩ් මුරගේ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්)
බන්ධනාගාර මූලස්ථානය
දිනය : 2025/05/27 කොළඹ 09.

අත්සන :..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :..........................................
තනතුර :..........................................
දිනය : 2025/05/28
නිලමුද්‍රාව : එච්.එම්.ටී.එන්. උපුල්දෙණිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

ඇමුණුම 03

<u>විභාග පිළිබඳ ආකෘතිය</u>

01. විභාගයේ නම :බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයට අයත් තනතුරු වන සරඹ උපදේශක තනතුර සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. මානව හිමිකම් හා සිරකරුවන්ට අදාළ ජාත්‍යන්තර නීතිරීති | පැය 02 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| I.මානව හිමිකම් හා සිරකරුවන්ට අදාළ ජාත්‍යන්තර නීති රීති | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන, ශ්‍රී ලංකා මානව හිමිකම් පනත සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් නිකුත් කර ඇති සිරකරුවන්ට අදාළ නීති රීති (නෙල්සන් මැන්ඩෙලා රීති) |

සකස් කළේ :

අත්සන :..........................

නම :ඩබ්ලිව්.ඩී.එස්. වසන්ත කුමාර

තනතුර :පරිපාලන නිලධාරී

දිනය : 2025/05/

බන්ධනාගාර මූලස්ථානය

කොළඹ - 09.

පරීක්ෂා කළේ :

අත්සන :..........................

නම : ඩොනල්ඩ් මුරගේ

තනතුර: බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්)

බන්ධනාගාර මූලස්ථානය

කොළඹ 09.

දිනය : 2025/05/

අත්සන :..........................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :..........................

තනතුර :..........................

දිනය : 2025/05/ 28

නිලමුද්‍රාව : එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

බන්ධනාගාර මූලස්ථානය

කොළඹ 09.